සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2022 ජනවාරි

## (203) ව්‍යාපාර නීතිය

(Business Law)

2022-03-19
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.6 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් නීති අතුරෙන්, ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ යාපනය අර්ධද්වීපයේ වෙසෙන දෙමළ වැසියන්ට පමණක් අදාලවන නීතිය කුමක් ද?

(1) රෝම-ලන්දේසි (Roman-Dutch) නීතිය. (2) ඉංග්‍රීසි නීතිය.

(3) තේසවලාමෙයි (Thesawalamai) නීතිය. (4) මුස්ලිම් නීතිය.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, භාණ්ඩ විකිණීමේ ගිවිසුමකට අදාලව විකුණුම්කරු වෙත ඇති ප්‍රතිකර්මයක් (remedy) **නොවන්නේ** කුමක් ද?

(1) නැවත විකිණීමේ බලය. (2) ලියමේ බලය.

(3) භාණ්ඩ මඟ නතර කිරීමේ බලය. (4) නියත ඉටුකිරීමේ ආඥාවක් ලබා ගැනීම.

**1.3** පහත සඳහන් ප්‍රකාශ සළකා බලන්න:

**(a)** පාර්ලිමේන්තු වරප්‍රසාද කඩකිරීම සම්බන්ධයෙන් අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට හිමිවේ.

**(b)** දිස්ත්‍රික් අධිකරණය, මුල් අවස්ථාවේ අධිකරණයක් ලෙස සළකනු ලැබේ.

**(c)** දික්කසාද සහ දරුවන්ගේ භාරකාරීත්වය සම්බන්ධ නඩු, මහේස්ත්‍රාත් අධිකරණය මගින් විභාග කරනු ලබයි.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකාවේ වර්තමාන අධිකරණ පද්ධතියට අදාල නිවැරදි ප්‍රකාශ වන්නේ:

(1) **(a)** සහ **(b)** පමණි.
(2) **(b)** සහ **(c)** පමණි.
(3) **(a)** සහ **(c)** පමණි.
(4) ඉහත සඳහන් සියල්ලම.

**1.4** 1980 අංක 46 දරණ සේවක භාරකාර අරමුදල් පනත යටතේ ආවරණය වන සේවක කාණ්ඩයක් වන්නේ:

(1) ජාතික ආධුනිකත්ව මණ්ඩලය යටතේ එන ආධුනිකයින්.

(2) සංස්ථා සේවකයින්.

(3) විශ්‍රාමික රාජ්‍ය සේවකයින්.

(4) ගෘහස්ථ සේවකයින්.

**1.5** භාණ්ඩවල වර්ගය, ප්‍රමාණය සහ ගමනාන්තය ඇතුලත් කරමින් භාණ්ඩ භාර දෙන්නා විසින් නැව් හිමියාට නිකුත් කරනු ලබන නීතිමය ලියවිල්ල වන්නේ:

(1) ණයවර ලිපිය.
(2) නෞභාර පත්‍රය.
(3) ඉන්වොයිසිය.
(4) විනිමය බිල.

**1.6** පහත සඳහන් සේවක කාණ්ඩ සළකා බලන්න:

**(a)** සමුපකාර සමිතියක සේවය කරන සේවකයින්.

**(b)** ගෘහ සේවිකාවන්, පෞද්ගලික රියැදුරන් වැනි ගෘහස්ථ සේවකයින්.

**(c)** පෞද්ගලික අංශයේ සේවය කරන සේවකයින්.

**(d)** රාජ්‍ය, පළාත් සභා හෝ පළාත් පාලන ආයතනවල සේවය කරන සේවකයින්.

ඉහත සඳහන් සේවකයින් අතුරෙන්, 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ බැහැර කරන ලද සේවක කාණ්ඩ වන්නේ:

(1) **(a), (b)** සහ **(d)** පමණි.
(2) **(a), (c)** සහ **(d)** පමණි.
(3) **(b), (c)** සහ **(d)** පමණි.
(4) ඉහත සඳහන් සියල්ලම.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 12)

*අංක 1.7 සිට 1.9 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.7** සාප්පු සහ කාර්යාල සේවක පනත මඟින් වයස අවුරුදු 18 ට අඩු කිසිම අයෙකු සාප්පුවක හෝ කාර්යාලයක සේවයේ යෙදවීම තහනම් කර ඇත.

**1.8** ස්ථානය, භාණ්ඩ විකිණීමේ ගිවිසුමක මූලිකාංගයක් වේ.

**1.9** CIF ගිවිසුමක් (CIF Agreement) යටතේ, ගැනුම්කරුට වාසිදායක වන අයුරින් රක්ෂණ ගිවිසුමකට එළඹීම, විකුණුම්කරුගේ වගකීමක් වේ. (එකකට ලකුණු 01 බැගින්, ලකුණු 03)

*අංක 1.10 සිට 1.14 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.10** සේවා ස්ථානයක් තුළ සේවකයන්ට හිමිවන මානව අයිතිවාසිකම් දෙකක්(02) සඳහන් කරන්න.

**1.11** අන්තර්ජාතික වෙළෙඳ ආරවුලක් විසඳීම සඳහා භාවිත කළ හැකි අධිකරණමය නොවන විසඳුම් දෙකක්(02) සඳහන් කරන්න.

**1.12** භාණ්ඩ විකිණීමේ ආඥා පනත යටතේ ඇති ව්‍යංග කොන්දේසි දෙකක්(02) සඳහන් කරන්න.

**1.13** ශ්‍රී ලංකාවේ සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ ප්‍රධාන කාර්යයන් දෙකක්(02) සඳහන් කරන්න.

**1.14** සේවකයා සහ ස්වාධීන කොන්ත්‍රාත්කරු අතර වෙනස හඳුනා ගැනීම සඳහා භාවිත කළ හැකි පරීක්ෂණයන් දෙකක්(02) සඳහන් කරන්න. (එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)

(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

### 02 වන ප්‍රශ්නය

කුඩා ළමුන් සඳහා කාටූන් චිත්‍රපට නිෂ්පාදනය කිරීමේ හවුල් ව්‍යාපාරයක් **ටොම්** සහ **ජෙරී** ආරම්භ කරන ලදී. පරිගණක මෘදුකාංග භාවිතයෙන් නිර්මාණය කරනු ලබන සජීවීකරණ කාටූන් (animations) මත පදනම්ව ඔවුන්ගේ ව්‍යාපාරය දියුණු කිරීමට ඔවුන් එක්ව වැඩ කළහ. කෙසේවුවද, **ජෙරී** විසින් **සීමාසහිත ABC පරිගණක සමාගම** වෙතින් පරිගණක මෘදුකාංගයක් වට්ටමක් යටතේ මිලදීගෙන ඔහු එය වෙළෙඳපොළේ දැනට පවතින මිලට, එනම් ඔහු ලබාගත් මිල මෙන් දෙගුණයකට හවුල් ව්‍යාපාරයට විකුණා ඇති බව **ටොම්** විසින් සොයා ගන්නා ලදී. මෙම ගනුදෙනුවෙන් **ජෙරී** රහස් ලාභයක් ඉපැයූ අතර, එය **ටොම්** සමඟ බෙදා නොගත්හ.

තවද, **ජෙරී** විසින් හවුල් ව්‍යාපාරයේ ව්‍යාපාර කටයුතුවලට සමාන ව්‍යාපාරයක් ආරම්භ කොට ඇති බවත් හවුල් ව්‍යාපාරයට අයත් පරිගණක මෘදුකාංග **ජෙරී** විසින් ඔහුගේ ව්‍යාපාරයේ කටයුතු සඳහා භාවිතකරන බවත් **ටොම්** විසින් සොයාගන්නා ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) හවුල්කරුවෙකු වශයෙන් **ජෙරී** විසින් ඔහුගේ බැඳීම් (duties) පැහැර හැර තිබේද යන්න **විමසන්න**.

(ලකුණු 07)

(b) මේ සම්බන්ධයෙන් **ටොම්ගේ** නෛතික අයිතිවාසිකම් **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

සීඝ්‍රයෙන් වෙනස්වන ව්‍යාපාර පරිසරය තුළ, ව්‍යාපාරයන්ට සහ ඇල්මැති පාර්ශවයන්ට බලපාන නව ප්‍රවණතා දිනෙන් දින ඉස්මතු වෙමින් පවතී. එමනිසා, මෙම නව ප්‍රවණතා සහ ඒවාට හේතුවන මූලිකාංග නියාමනය කිරීම සඳහා නෛතික ආකෘතිමය රාමුවක් සකස් කිරීම අත්‍යවශ්‍ය වේ. ක්‍රියාකාරකම් නියාමනය කිරීම සහ ජනතාවගේ ආරක්ෂාව සඳහා ශ්‍රී ලංකාව තුළ නව නීති සහ රෙගුලාසි කිහිපයක් හඳුන්වා දී තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2006 අංක 06 දරණ මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනතේ අරමුණු දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(b) 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනත මඟින් ආවරණය වන බුද්ධිමය දේපළ වර්ග තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

බහුජාතික සමාගමක සේවය කරන **සරත්** සහ **මාලන්** හොඳ මිතුරෝ වෙති. ඔවුන් දෙදෙනාටම ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සඳහා රක්ෂණ ආවරණ ලබා ගැනීමට අවශ්‍ය විය. **සරත්** විසින් ඔහුට සහ ඔහුගේ බිරිඳ වන **රෝසි** සඳහා ජීවිත රක්ෂණ ආවරණ අයදුම්කරන ලදී. **මාලන්** අවිවාහකයෙක් වන අතර, ඔහු විසින් ඔහුගේ මෝටර් රථය සඳහා සාමාන්‍ය රක්ෂණ ආවරණයක් සහ ඔහුගේ වැඩිමහල් සොහොයුරිය වන **ප්‍රියා** වෙනුවෙන් ජීවිත රක්ෂණ ආවරණයක් අයදුම් කරන ලදී. රක්ෂණ සමාගම, **මාලන්** විසින් ඔහුගේ සොහොයුරිය සඳහා අයදුම් කරන ලද රක්ෂණ අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප කළ නමුත්, **රෝසි** වෙනුවෙන් **සරත්** අයදුම් කළ රක්ෂණ අයදුම් පත්‍රය පිළිගන්නා ලදී.

මාස 3 කට පසුව, **මාලන්ගේ** මෝටර් රථය නවතා ඇති විටකදී ඒ මතට ගසක් පෙරළීමෙන් ඊට අලාභහානි සිදුවිය. ඔහු රක්ෂණ වන්දි ඉල්ලා සිටින විට **මාලන්** විසින් ඔහුගේ රක්ෂණ අයදුම් පත්‍රයේ ඇතැම් කරුණු යටපත් කර ඇති බව දන්වමින් රක්ෂණ සමාගම ඔහුගේ වන්දි හිමිකම ප්‍රතික්ෂේප කරන ලදී. ඔහු, ඔහුගේ රක්ෂණ අයදුම් පත්‍රයේ සඳහන්කොට ඇත්තේ මෝටර් රථය ගරාජයක නවතා තබන බවයි. නමුත්, ඔහු සාමාන්‍යයෙන් ඔහුගේ මෝටර් රථය කුඹුරක් අසල වූ ගසක් යට නවතා තිබෙන බව රක්ෂණ සමාගම විසින් සොයාගන්නා ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **මාලන්** විසින් සිය සොහොයුරියගේ ජීවිත රක්ෂණය වෙනුවෙන් අයදුම් කළ අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමටත්, **සරත්** විසින් ඔහුගේ බිරිඳගේ ජීවිත රක්ෂණය වෙනුවෙන් අයදුම් කළ අයදුම්පත පිළිගැනීමටත් හේතු **විමසන්න**. (ලකුණු 06)

(b) හානියට පත් වූ මෝටර් රථය සම්බන්ධයෙන් **මාලන්ගේ** වන්දි හිමිකම රක්ෂණ සමාගම විසින් ප්‍රතික්ෂේප කිරීමට පාදක වූ කරුණු **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

ගනුදෙනු කළහැකි ලියවිල්ලක් යනු ඉල්ලූ විටදී හෝ නිශ්චිත වේලාවකදී ස්ථාවර මුදලක් ගෙවීම සඳහා වන ලිඛිත නියෝගයක් හෝ කොන්දේසි විරහිත පොරොන්දුවකි. එය එක් පුද්ගලයෙකුගෙන් තවත් පුද්ගලයෙකුට පැවරිය හැකි අතර, එසේ පැවරීමෙන් පසු දරන්නාට ලියවිල්ලේ සම්පූර්ණ නීත්‍යානුකූල හිමිකම ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) චෙක්පතක් සහ විනිමය බිල්පතක් අතර ඇති වෙනස්කම් තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) විනිමය බිල්පතක් සම්බන්ධයෙන් යථා කාලීන දරන්නෙකු වීම (holder in due course) සඳහා සපුරාලිය යුතු ලක්ෂණ හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(c) විනිමය බිල්පතක අණකරුගේ වගකීම් තුනක්(03) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## **06** වන ප්‍රශ්නය

**සශ්‍රීක** ශ්‍රී ලංකාවට රසායනික පොහොර ආනයනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලැබේ. ඔහු විසින් රු. මිලියන 100 ක් වටිනා රසායනික පොහොර තොගයක් චීනයෙන් මිලට ගත් අතර, එය **මර්මේඩ්** නම් නෞකාවෙන් ශ්‍රී ලංකාව බලා ප්‍රවාහනය කළේය. ශ්‍රී ලංකාව තුළ රසායනික පොහොර තහනම් කර ඇති වන්මන් දේශපාලන වාතාවරණය හේතුවෙන් මෙම නෞකාව මාසයකට ආසන්න කාලයක් ඉන්දියාවට ආසන්න ගැඹුරු මුහුදේ නවතා තිබුණි. දීර්ඝ කාලයක් ගැඹුරු මුහුදේ නවතා තැබීම හේතුවෙන් පොහොර බහාලුම් තුළ රසායනික ප්‍රතික්‍රියාවක් පෙන්නුම් කරන බව නැවේ කපිතාන් වූ **කුල් මහතාගේ** අවධානයට යොමු විය. ඔහු තම වියදමෙන් එම බහාලුම් ඉන්දියාවේ චෙන්නායි වරායේ ගබඩා කිරීම සඳහා පියවර ගනු ලැබිණ. ඔහු විසින් සිදුවූ දේ කුමක්දැයි පැවසීමට **සශ්‍රීක** ව ඇමතීමට උත්සාහ කළ නමුත් ඔහුගෙන් කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණි. සති දෙකකට පමණ පසු **කුල් මහතාට** තවදුරටත් ගබඩා ගාස්තු ගෙවීමට මුදල් නොමැතිකම හේතුවෙන්, එම පොහොර තොගය විකිණීමට තීරණය කරන ලදී. රු. මිලියන 75 කට එම පොහොර තොගය විකුණා දමන ලද අතර, ඔහු එම මුදල **සශ්‍රීක** වෙත යැවීමට කටයුතු කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) පොහොර විකිණීම සම්බන්ධයෙන් **කුල් මහතා** සහ **සශ්‍රීක** අතර නියෝජ්‍යත්ව සම්බන්ධතාවයක් තිබේදැයි **විමසන්න**. (ලකුණු 07)

(b) **කුල් මහතා** විසින් දරණ ලද ගබඩා පිරිවැය **සශ්‍රීකගෙන්** අයකර ගත හැකිද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 25)

## 07 වන ප්‍රශ්නය

(A) **සමන්** සහ ඔහුගේ බිරිඳ වන **පියුමි** විසින් නුවරඑළියේ **"වික්ටෝරියා හෝටලයේ"** සුඛෝපභෝගී කාමරයක් වෙන්කරවා ගන්නා ලදි. හෝටල් පරිශ්‍රයට පැමිණීමෙන් පසු ඔවුන් තම මෝටර් රථය නැවැත්වීම සඳහා ස්ථානයක් සෙවූ අතර, හෝටලයේ සිටි ආරක්ෂක නිලධාරීන්ගෙන් කෙනෙකු රථගාලට යන දිශාව පෙන්වා දෙන ලදි. නමුත් ඔහු ප්‍රකාශ කරනු ලැබුවේ *"මහත්මයාණෙනි, කොවිඩ්-19 සෞඛ්‍ය මාර්ගෝපදේශ මත ඉතා සීමිත කාර්යමණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාවක් පමණක් සේවයේ යෙදී සිටින බැවින් වාහන නැවැත්වීමේ පහසුකම් සපයා ඇති නමුත් ඒ සඳහා ආරක්ෂක පහසුකම් ලබාදී නොමැති බවත් ය."*

දින තුනක් සඳහා කාමර ගාස්තු ගෙවීමෙන් පසු, ඔවුන් තමන්ගේ කාමරයට ඇතුළු විය. කාමරයේ දොරේ ස්ථානගත කර ඇති පුවරුවක් **සමන්ගේ** නෙත ගැටිණි. එම පුවරුවේ සඳහන්ව තිබුණේ *"අස්ථානගත වූ හෝ සොරකම් කරන ලද කිසිදු භාණ්ඩයක් සඳහා කිසිදු තත්ත්වයක් යටතේ හෝටල් කළමනාකාරිත්වය වග කියනු නොලැබේ"* යන්නයි.

මෙම හෝටලයේ ආලින්දයේ **මැණිකා** විසින් ස්වර්ණාභරණ අලෙවිසැලක් පවත්වාගෙන ගිය අතර, ඇය සාප්පුවේ කවුළුව තුළ ඩොලර් ($) 4,000 ක් ලෙස මිල සඳහන් කර තිබූ මිල අධික මැණික් මාලයක් ප්‍රදර්ශනයට තබා තිබුණි. මෙම මාලය ප්‍රථමයෙන්ම වික්ටෝරියා රැජිනට අයත්ව තිබූ පෞරාණික භාණ්ඩයක් බව තවදුරටත් සඳහන් කර තිබුණි. පෞරාණික භාණ්ඩවලට දැඩි කැමැත්තක් සහ ස්වර්ණාභරණ එකතු කරන්නියක් වූ **පියුමිට,** මෙම මාලය මිලට ගැනීමට අවශ්‍ය විය. නමුත් **මැණිකා** එම මාලය විකිණීමට නොව ප්‍රදර්ශනයට පමණක් තබා ඇති බව ප්‍රකාශ කරමින් විකිණීම ප්‍රතික්ෂේප කරන ලදි.

හෝටලයෙන් පිටත්ව යාමට සූදානම් වන අවස්ථාවේ, **පියුමි** ඔවුන්ගේ කාමරයේ තබා තිබූ ඇයගේ කර මාලය එහි නොමැති බව දුටුවාය. එමෙන්ම ඔවුන්ගේ මෝටර් රථයේ අමතර රෝදය ද අස්ථානගත වී ඇති බව පසුව ඔවුන්ට දැන ගැනීමට ලැබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **පියුමි** සහ **මැණිකා** අතර වලංගු ගිවිසුමක් පවතී ද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(b) නැතිවූ වස්තූන් සම්බන්ධයෙන් **"වික්ටෝරියා හෝටලය"** ට එරෙහිව, **සමන්** සහ **පියුමි** සතු නෛතික අයිතිවාසිකම් (legal rights) **විමසන්න**. (ලකුණු 07)

(c) තම සේවාදායකයාගේ නැතිවූ වස්තූන් සම්බන්ධයෙන් **"වික්ටෝරියා හෝටලය"** ට ඇති නෛතික අයිතිවාසිකම් (legal rights) **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(B) **අමල්** මොණරාගල ප්‍රදේශයේ ගොවීන්ට කාබනික පොහොර අලෙවිකරනු ලබන එම ප්‍රදේශයේ ව්‍යාපාරිකයෙකි. **අමල්** විසින් **රාජ්ගේ** කොළඹ පිහිටි ගබඩාවෙන් කාබනික පොහොර කිලෝග්‍රෑම් 10,000 ක් මිලදී ගැනීම සඳහා ගිවිසුමක් අත්සන් කරන ලදි. **රාජ්,** ශ්‍රී ලංකාවට කාබනික පොහොර ආනයනය කරන්නෙකු වේ. ගිවිසුමට එළඹීමට පෙර, **අමල්** විසින් **රාජ්** ලබාදුන් කාබනික පොහොර නියැදියක ගුණත්වය පරීක්ෂා කරන ලදි. ඇණවුම් කරන ලද කිලෝග්‍රෑම් 10,000 ක කාබනික පොහොර, කිලෝග්‍රෑම් 50 බැගින් වූ මළුවලින් ලැබුණු අතර, **අමල්** ඒවා ප්‍රදේශයේ ගොවියන් අතර, අලෙවිකරනු ලැබිය. දින දෙකකට පමණ පසුව, පොහොරවල අඩු ගුණාත්මකභාවය පිළිබඳ ගොවීන් චෝදනා කළ අතර, මිලට ගත් සියලු පොහොර මළු ඔවුන් **අමල්** වෙත ආපසු එවන ලදි. කාබනික පොහොරවල ගුණාත්මකභාවය, ගිවිසුම්ගත වීමට පෙර ඔහු පෞද්ගලිකව පරීක්ෂාකළ සාම්පලයේ ගුණාත්මකභාවය සමඟ නොගැළපෙන බව පසුව **අමල්ට** වැටහුණි. තවද, මෙම පොහොර තොගයේ ඇති දුර්වල ගුණාත්මකභාවය සහ රසායනික අන්තර්ගතය හේතුවෙන් කාබනික එළවළු වගාව සඳහා මෙම පොහොර තොගය සුදුසු නොවන බව ඔහු වටහාගෙන තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

භාණ්ඩ විකිණීමේ ආඥා පනත යටතේ **රාජ්ට** එරෙහිව **අමල්ගේ** නෛතික අයිතිවාසිකම් (legal rights) **විමසන්න**.

(ලකුණු 10)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **දැනුම (1)** | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **අවබෝධය (2)** | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **භාවිතය (3)** | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **විශ්ලේෂණය (4)** | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |